# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,194 - 2020 සැප්තැම්බර් මස 18 වැනි සිකුරාදා - 2020.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 596 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2020 ඔක්තෝබර් මස 09 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 සැප්තැම්බර් මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

බස්නාහිර පළාත්බද වාණිජ මහාධිකරණයේ දී

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී.
අංක 21, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත,
කොළඹ 01.

*නඩු අංකය* : HC Civil/135/13/MR
*ස්වභාවය* : *උකස් බැඳුම්කරය*
*කාර්ය පටිපාටිය* : සාමාන්‍ය
*වටිනාකම* : *රු.* 5,125,922.62

..........................*පැමිණිලිකරු.*

*එදිරිව*

හේවාපතිරණගේ අනුර *නොහොත්*
හේවාපේදිගේ අනුර හේවා පතිරන
අංක 21, කෙලින් වීදිය, මීරිගම.

.................................*විත්තිකරු.*

ඉහත සඳහන් නඩුවේ වර්ෂ 2017 ක්වූ අගෝස්තු මස 23 වැනි දින දරන කොළඹ වාණිජ මහාධිකරණයේ නඩු තීන්දුව ප්‍රකාරව විත්තිකරුගෙන් පැමිණිලිකාර බැංකුවට අයවිය යුතු,

**පළමුවන නඩු නිමිත්ත** මත 2012 පෙබරවාරි මස 24 වැනි දින දක්වා ගෙවීම හිඟ තබා ඇති ප්‍රාග්ධන මුදල වන රු. 2,997,165.84 ක මුදලක් සහ එකී ගෙවීම හිඟ තබා ඇති ප්‍රාග්ධන මුදල මත 2012 පෙබරවාරි මස 25 වැනි දින සිට එම මුදල් මත වර්ෂයකට 22% ක වැඩිදුර පොළියක් ද,

**දෙවන නඩු නිමිත්ත** මත 2012 පෙබරවාරි මස 24 වැනි දින දක්වා ගෙවීම හිඟ තබා ඇති ප්‍රාග්ධන මුදල වන රු. 750,000 ක මුදලක් සහ එකී ගෙවීම හිඟ තබා ඇති ප්‍රාග්ධන මුදල මත 2012 පෙබරවාරි මස 24 වැනි දින දක්වා අයවීමට තිබෙන රු. 611,523.56 ක පොළිය සහ එකී ගෙවීම හිඟ තබා ඇති මුදල 2012 පෙබරවාරි මස 25 වැනි දින සිට එම මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් වර්ෂයකට 22% ක වැඩිදුර පොළියක් ද,

**තුන්වන නඩු නිමිත්ත** මත ගෙවීම හිඟ තබා ඇති ප්‍රාග්ධන මුදල වන රු. 425,000 ක මුදලක් සහ එකී ප්‍රාග්ධන මුදල මත 2012 පෙබරවාරි මස 24 වන දින දක්වා අය වීමට තිබෙන රු. 342,233.22 පොළිය සහ රු. 425,000 ක් වූ එකී ගෙවීම හිඟ තබා ඇති ප්‍රාග්ධන මුදල මත 2012 පෙබරවාරි මස 25 වැනි දින සිට එම මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් වර්ෂයකට 22% ක අනු ප්‍රමාණයක් අනුව වූ වැඩිදුර පොළියක් ද සහ නඩු ගාස්තු ද අය කර ගැනීම සඳහා විත්තිකරුට විරුද්ධව ප්‍රකාශයට පත් කරන ලද නඩු තීන්දුව ප්‍රකාර ක්‍රියා කිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති බැවින්, එකී මුදල පැමිණිලිකාර බැංකුවට අය කර ගැනීම සඳහා මා වෙත නිකුත් කරන ලද විකිණීමේ අධිකාරී පත්‍රයේ බලය පිට විත්තිකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නඩුවට අදාල උකස් දේපල, වර්ෂ **2020 ක් වූ ඔක්තෝබර් මස 20 වැනි දින ප.ව 12.30** ට එකී දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

*දේපලට පිවිසීම :*

මීරිගම දුම්රියපල පසුකර මීටර් කීපයක් ඉදිරියට ගමන් කර බෝගස අසලින් වමට හැරී මීගමුව පාරේ මීටර් 850 ක් පමණ ගමන් කර දකුණට හැරී සංඝමිත්තා මාවතේ (තාර දමා ඇති පාර) මීටර් 50 ක් පමණ ඉදිරියට ගමන්කර නැවත වමට හැරී පළවන පටුමග දිගේ (බොරළු පාර) මීටර් 250 ක් පමණ ගමන් කර පළමු වංගුවෙන් වමට හැරී මීටර් කීපයක් ගමන් කිරීමෙන් දේපලට ලඟා විය හැක. අදාළ දේපල පාරේ වම් අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය :*

වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් නියෝජ්‍ය පිස්කල් වෙත මුදලින් ගෙවිය යුතුය. චෙක්පත් භාර ගනු නොලැබේ.

1. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25% ක් දේපල මිලදී ගත් වහාම ගෙවිය යුතු වන අතර, ඉතිරි 75% ක මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුලත නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

2. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය අනුව ගැණුම්කරු විසින් ගැණුම් මිලෙන් පළමු රු. 7,500 සඳහා රු. 150 ක ගාස්තුවක් ද, රු. 7,500 ඉක්මවන සෑම රු. 1,000 ක් සඳහා ම රු. 5 බැගින් ද, පිස්කල් ගාස්තු හා විකුණුම් ගාස්තු ගෙවිය යුතුය.

**ඉහත සඳහන් උපලේඛනය**

බස්නාහිර පළාතේ (මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය ඇතුළත) ගම්පහ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරලයේ උඩුගහ පත්තුවේ මුගුරුගම්පොල පිහිටා ඇත්තා වූ ද උතුරින් , එච්.ටී.පී ඉන්ද්‍රපාලට අයත් කන්දෙහේන වත්තෙන්, නැගෙනහිරින් ඃ පාරෙන් සහ අයි. පී. ලීන් හා වෙනත් තැනැත්තන්ට අයත් මේ ඉඩම් කොටසින්, දකුණින් ඃ අයි. පී. ලීන් හා වෙනත් තැනැත්තන්ට අයත් මේ ඉඩමේ කොටසින් හා ප්‍රා. ස. පාරෙන් සහ බස්නාහිරින් එච්. පී. ගිරෝනිස්ට අයත් මේ ඉඩමේ කොටසින් මායිම් වුව ද, ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් තිස් එකයි දශම හතයි හතරකින් (අ. 0, රූ. 3, පර්. 31.74) *නැතහොත්* හෙක්ටයාර් 0.3838කින් යුක්ත වුව ද මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 270/168 පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත්තා වූ ද ''ඉහළගහවත්ත *නොහොත්* මාරගහවත්ත'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම් කැබලි කිහිපයෙන් බලයලත් මිනින්දෝරු කේ. කේ. කනගසබෙයි විසින් සාදන ලද අංක 618 හා 1997.06.01 වන දින දරන පිඹුරේ අංක 1 හා 2 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුළු ඒකාබද්ධ කරන ලද ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ වැවිලි ගොඩනැගිලි හා වෙනත් සියළු දේද සමග වේ.

අධිකරණයේ අණ පරිදි,

ආර්. කේ. ගාමිණී වීරසිරි,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,

2020 අගෝස්තු මස 28 වැනි දින,
වාණිජ මහාධිකරණය - කොළඹ 12.

09-409

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.